**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2021**

**------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 9 ඡේදය ප්‍රකාරව, මුදල් සහ මුදල් හා සමාන දෑ ලෙස හෙළිදරව් කළ යුතු මාස 03 කින් කල් පිරෙන ස්ථාවර තැන්පතු රු.13,806,343 ක්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ හෙළිදරව් කර තිබුණි. | මෙම මාස 03 කින් කල් පිරෙන ස්ථාවර තැන්පතු පර්යේෂණ අරමුදල, ත්‍යාග අරමුදල, මහෝපාධ්‍යාය අරමුදල ආදී නිශ්චිත අරමුණක් සඳහා පවත්වා ගෙන යන අරමුදල් ආයෝජනය කිරීම්වලින් සමන්විත වන බව, මෙම ස්ථාවර තැන්පතු සාමාන්‍ය භාවිතයට ගැනීම සීමා කර ඇති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 76 ඡේදයෙහි (ඇ) වගන්තිය ප්‍රකාරව "ජංගම නොවන වත්කම්" ලෙස වර්ගීකරණය කර ඇති බව. | නිවැරදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය හඳුනා ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර | සම්පූර්ණයෙන් ක්ෂය කළ වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බව, පවතින සම්පත්වල හිඟය මත මෙවැනි ප්‍රතිපත්තියක් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණු පිරිවැය රු.92,177,529 ක් වූ වත්කම් විෂයයන් 08 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නොතිබුණි. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අපහසු බව හා මෙම වත්කම් සියල්ල 2022 වසරේදී විශේෂඥ කමිටුවක හා/ හෝ තක්සේරු දෙපාර්තමේන්තුවේ සහය මත ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව ගිණුම්වල ගැලපීමට කටයුතු කරන බව. | |

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දින වන විට අනාගත ගෙවීමේ බැඳීමක් නොතිබුණු විශේෂ අරමුදල් රු.313,806,708 ක් හා පරිත්‍යාග රු.17,030,262 ක් පොදු අරමුදලට බැර කිරීම වෙනුවට එදිනට ජංගම නොවන වගකීම් ලෙස හෙළිදරව් කර තිබුණි. | 2022 වර්ෂයේදී මෙම වරද නිවැරදි කරන බව. | වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව නිල නිවාස හිමිකම සහිත නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 10 ක් අයකළ යුතු නමුත්, භික්ෂු විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ ලේඛකාධිකාරී යන තනතුරු සඳහා වෙන්කර තිබුණු නිල නිවාසවලින් අයකළ යුතු රු.310,788 ක් අයකර නොතිබීම හා ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ. | මෙම නිල නිවාස සම්බන්ධයෙන් මාසිකව අයකර ගත යුතු කුලිය නිවාස කමිටුව විසින් තීරණය කර නොමැති බව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් ප්‍රකාරව නිල නිවාසවල පිහිටීම හා සපයා නොමැති පහසුකම් සලකා බැලීමෙන් පසු අයකළ යුතු නිවාස කුලිය නිවාස කමිටුව විසින් තීරණය කරන බව හා ඉන් පසු අය කර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර හිඟ කුලී අය කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂ ගණනාවක සිට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පුස්තකාල පොත් 1,977 ක අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වසර තුළ පුස්තකාලයාධිකාරී විසින් මූල්‍ය අංශය වෙත දන්වා තිබුණු පරිත්‍යාග පොත් සියල්ල තක්සේරු කර ඇති බව හා 2021 දෙසැම්බර් 31 දිනෙන් පසු හඳුනා ගන්නා ලද පොත්වල වටිනාකම් 2022 වර්ෂයේ ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ගත කර නොමැති පොත්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) හා 38 (2) වගන්ති | එක් එක් අස්ථිත්‍යයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර එහි ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් කාර්තුමය ප්‍රගති සමාලෝචනයක් සිදු කරන බව. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදය | | | |
| | (i) 5.2.1 ඡේදය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ භික්ෂුන් වහන්සේලා 39 දෙනෙකු සඳහා නිවාස පහසුකම් ලබාදීම වෙනුවෙන් වැටුපෙන් සියයට 7.5 ක මාසික නිවාස කුලියක් අය කළ යුතු වුවද, එක් අයකුගෙන් මාසිකව රු.500 ක කුලියක් පමණක් අයකර තිබුණි. අඩුවෙන් අයකර තිබුණු නිවාස කුලී රු.2,354,348 ක් විය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2020 දෙසැම්බර් 09 දිනැති ලිපියේ සඳහන් කරුණු හා සපයා ඇති පහසුකම් සැලකිල්ලට ගෙන කුලී අයකළ යුතු නම් ඒ බව නිවාස කමිටුව තීරණය කරන බව හා ඉන් පසුව කුලී අයකිරීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 5.8 ඡේදය | විශ්වවිද්‍යාලයේ නිලධාරීන් වෙත ලබාදී තිබුණු නිවාස 06 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී විදුලිය, ජලය, දුරකථන ගාස්තු ලෙස එකතුව රු.1,544,243 ක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි. | කථිකාචාර්ය නේවාසිකාගාර හා අංශ ප්‍රධානීන්ගේ නේවාසිකාගාර යටතේ පවතින ජල හා විදුලි වියදම නිශ්චය කළ නොහැකි බැවින් නාමික අගයක් තීරණය කිරීමටත්, ඒ අනුව නව ගාස්තුව ලෙස රු.500 ක මුදලක් අය කිරීමටත් 2017 මැයි 05 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී තීරණය කළ බව, නිල නිවාසවල පදිංචි පුද්ගලයන්ගෙන් ජල ගාස්තු හා විදුලි ගාස්තු වෙනම අය කර ගැනීමට හැකියාවක් නොමැති බව හා සපයා ඇති පහසුකම් සැලකිල්ලට ගෙන නිවාස කුලී තීරණය කිරීමට නිවාස කමිටුවේ අවධානය යොමු කර ඇති බව. | -එම- |
| (ඇ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4.2 ඡේදය | පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය මගින් පවත්වාගෙන යනු ලබන බාහිර උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා 06 ක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අදාළ ලිපි ලේඛන යොමු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදී තිබුණු රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සඳහා වූ මඟ පෙන්වීමෙහි 6.5.1 ඡේදය. | මුදල් වර්ෂය අවසානවී දින 60 ක් ඇතුළත ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන මාස 03 ක කාල ප්‍රමාදයකින් පසුව 2022 ජුනි 03 දින ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙම ප්‍රමාදයන් මඟ හරවා ගැනීමට කටයුතු කරන බව. | රාජ්‍ය ව්‍යාපාර යහපාලනය සඳහා වූ මඟ පෙන්වීම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 4 (ii) ඡේදය | පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස 06 ක් තුළ පර්යේෂණ යෝජනාවට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණය සඳහා වන | මේ වන විට අවසන් පර්යේෂණ වාර්තා පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂයේ ආරම්භ කර තිබුණු කථිකාචාර්යයවරුන් 05 දෙනෙකුගේ පර්යේෂණයන්හි ප්‍රගතිය පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.47,292,364 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.46,170,652 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,121,712 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.2,048,008 කින්, ආයෝජන පොලී රු.1,373,904 කින් හා විවිධ ආදායම් රු.1,853,398 කින් අඩුවීම හා විවිධ පුනරාවර්ථන වියදම් රු.1,448,058 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning) ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පිළියෙල කර තිබුණු ලංසු ලියකියවිලිවලට අනුව ජයග්‍රාහී ලංසුකරු මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු.මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු වුවද, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු ලංසුකරුවෙකු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරා ගෙන තිබුණි. මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 8 ක් වූ කොන්ත්‍රාත්තුව, ගිවිසුම් ප්‍රකාරව 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු වුවද 2022 මාර්තු 31 දින වන විටත් රු.මිලියන 4 ක් පමණක් වැයකර තිබුණු අතර පද්ධතිය සම්පූර්ණ කරද නොතිබුණි. | ඉදිරි මාස 03 ඇතුළත තොරතුරු තාක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමට නියමිතව ඇති බව, එය ස්ථාපනය කිරීමෙන් පසු මොඩියුලවල පවත්නා දෝෂ නිවැරදි කරවා ගන්නා බව හා තොරතුරු තාක්ෂණ පද්ධතිය විශ්වවිද්‍යාලයට භාරගෙන භාවිතා කිරීමට කටයුතු කරන බව. | ලංසු කොන්දේසි ප්‍රකාරව කටයුතු කරමින් ලංසුකරු තෝරා ගත යුතු අතර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිම කරවා ගැනීමටත් වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතයට ගැනීමටත් නොපමාව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී මහාචාර්යය ස්වාමීන් වහන්සේ නමක් විසින් සිදුකර තිබුණු පර්යේෂණ 02 කට අදාළව රු.1,797,440 ක දීමනා එම ස්වාමීන් වහන්සේ වෙත නිකුත් කර තිබුණු නමුත්, 2022 මැයි 05 දින විටත් එම පර්යේෂණයන්ට අදාළ අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2022 අප්‍රේල් 27 දින පැවති පර්යේෂණ කළමනාකරණ කමිටුවේදී මේ පිළබඳව සාකච්ඡා කළ බව, අවසාන වාර්තාව ඉදිරිපත් කරන ලෙස එම ස්වාමීන් වහන්සේව දැනුවත් කර ඇති බව හා එතෙක් මෙම ස්වාමීන් වහන්සේ වෙත පර්යේෂණ දීමනා ගෙවීම නවතා ඇති බව. | පර්යේෂණ අවසන් වාර්තා නියමිත පරිදි ලබාගැනීමටත්, අවසන් වාර්තා ඉදිරිපත් නොකරන විට පර්යේෂණ දීමනා ගෙවීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 3(1) වගන්තියෙහි දැක්වෙන බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීමේ පරමාර්ථයට අනුකූලව පනතේ 3(v) වගන්තියේ දක්වා ඇති බෞද්ධ සංස්කෘතික සහ එහි අගයන් ප්‍රවර්ධනය කිරීම යන පරමාර්ථය ඉටුකළ යුතු වුවද, ඊට අනුකූල නොවන ලෙස විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය විසින් ජෝතිෂ්‍ය උසස් සහතික පත්‍ර පාඨමාලාව පවත්වන බව නිරීක්ෂණය විය. | ජ්‍යොතිෂය යනු ලාංකීය බෞද්ධ සංස්කෘතියට අනුගත වූවක් බැවින් සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතියෙන් ජ්‍යොතිෂය උසස් සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කර ඇති බව හා මෙය විශ්වවිද්‍යාලීය පනතේ අරමුණු හා පරමාර්ථ සමග අනුගත වන බව. | පනතේ 3(v) වගන්තියේ දක්වා ඇති බෞද්ධ සංස්කෘතික හා එහි අගයන් ප්‍රවර්ධනය කිරීම යන පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා කටයුතු කිරීමේදී පනතේ 3 (1) හි දක්වා ඇති බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම යන පරමාර්ථයට අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුළු පිරිවැය රු.80,843,406 ක් වූ 2020 ජනවාරි 14 දින වැඩ නිම කර තිබුණු විදේශ සිසුන් 25 දෙනෙකු සඳහා වූ නේවාසිකාගාරය 2022 මාර්තු 03 දින වන විට වසර 02 කට වඩා වැඩි කාලයක සිට නිෂ්කාර්යයව පැවති අතර එම ගොඩනැගිල්ලට සවිකර තිබුණු රු.3,411,000 ක විදුලිය හා සවිකිරීම්වල වගකීම් කාලයද භාවිතයට ගැනීමෙන් තොරව අවසන්වී තිබුණි. | රටෙහි පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙලෙස සිදුවී ඇති බව, කෙසේ නමුත් 2020/2021 අධ්‍යන වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ විදේශීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා තිදෙනෙක් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ බව හා එක් ස්වාමීන් වහන්සේ නමක් පමණක් ලියාපදිංචි වූ බව. | වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |